

භූත බංගලාව
W.M. නිසල දිනුලක වීරසිංහ

# භූත බංගලාව


## තිසල දිනුලක වීරසිංහ

**කතෘ**


**කතෘගේ වෙනත් කෘති :**

**කම්මැලි කුඹියා**

**පන්දුව**

**දූපතක දවසක්**

**TOYOTA STARLET**

| | | |
|---|---|---|
| **පාසල** | **:** | **මහ/මහාමායා බාලිකා විදුහල** |
| **ඉගෙනුම ලබන පන්තිය** | **:** | **9 S4 ශ්‍රේණිය** |
| **කෘතිය එල කරන දිනය** | **:** | 2026.05.10 |


| | | |
|---|---|---|
| **ISBN අංකය** | **:** | **978-624-211-290-9** |

# පිදුම

මගේ ජීවිතේ ආලෝකය දුන්න,

මගේ පළමු ගුරුවරුන් වූ,

මට ආදරය, විශ්වාසය, ලියන්නට දේවල් ඉගැන්වූ

**ආදරණීය අප්පච්චීට, අම්මාට,**

මගේ හිනාවට, කඳුළට, සෙල්ලම් වලට,

සහ මගේ කතා වලට මුල්ම අහන්නන් වූ

**ආදරණීය නැගණියට , අත්තාට, අත්තම්මාට,**

අකුරු කියවන්න, වචන ගොතන්න, සිහින දකින්න උගන්වපු,

මගේ දෙවන දෙමාපියන් වූ

ගෞරවණීය ශාන්ත සිල්වෙස්තර විද්‍යාලයෙ ගුරු මහත්ම මහත්මීන්ට,*

මේ මගේ E කතා පොත

කෘතවේදීත්වයෙන්, ආදරයෙන් පුද කරමි.

**9 S4 ශ්‍රේණිය**

**ශාන්ත සිල්වෙස්තර විද්‍යාලය, මහනුවර**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.


ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,


ශ්‍රී දළදා මාලිගාව.

මම හිටියේ ලස්සන ගමක. එක දවසක්, මම ගමේ හිටපු වයසකම කෙනාගෙන්  බූත බංගලාව ගැන ඇහුවා. ඒක ඇහුන  ගමේ මිනිස්සු බය උනා. "ඔයා ඒකටනම් යන්න හිතන්නවත් එපා!" එයාලා කිව්වා. මම හිතුවා, "මේක තමයි adventure එක!"කියලා





ගමේ අය මොනවා කිවුවත් මම බූත බංගලාවට යනවා කියල හිතලා මම ඒ බූත බංගලාවට ගියා. ගේට්ටුව නිකන්ම ඇරියා. "හූ!" කියලා සද්දයක් ආවා.



මම ගෙට ඇතුල් උනා. දූවිලි, වතුර බින්දු... හැමදේම ගුප්තයි. එක පාරටම,  මම ඇතුලට ආව දොරත් වැහිලා බල්බ් නිවී නිවී පත්තු වුනා.


මම ගොඩක් බයවෙලා

"අනේ මාව බීරගන්න !"කියලා  කිව්වා.




එලියට යන්න තියෙන දොර ලෝක වෙලා මම දොර ඇරගන්න හදද්දි එක පාරටම, සුදු පාට දුමක් අතරින් බූතයක් ආවා.

"හහ්!" මම හොදටම බය උනා. මගේ හදවත ගැහෙන සද්දේ මටම ඇහුනා .



භූතයා කිව්වා, "මම ඔයාව නිදහස් කරන්නම්. නමුත්, ඔයා මගේ ප්‍රශ්නෙට උත්තර දෙන්න ඕනෙ!" කියලා .




භූතයා මගෙන් ප්‍රශ්නේ ඇහුවා. "මේ ගෙදර රහස මොකද?" කියලා

මම ටිකක් හිතුවා හිතුවා. "මම් මම දන්නෙ නෑ!"කියලා කිව්වා


බූතයා කිව්වා, "හරි, ඔයාට තව
අවස්ථාවක්!"දෙන්නම් කියලා




මම ඒ රහස හොයන්න පටන් ගත්තා. එක පාරටම, ලොකු පොත් රාක්කෙකින් පොතක් බිමට වැටුනා. මම හිතුවා "මේක තමයි රහස!" කියලා මම ඉතින් පොත දිග ඇරියා.




ඒ පොතේ ලස්සන චිත්‍ර තිබුනා. ඒවගෙන් කියවෙන විදිහට "මේ ගෙදර 100 අවුරුද්දකට කලින් ගින්නක් ඇවිලීලා තියෙනවා කියල !" මම බූතයට කියෙව්වා.

බූතයා ඒක අහලා ආඩම්බර උනා. "හරි! ඔයා දිනුවා!"කියලා බූතයා කිව්වා


භූතයා කිව්වා, "මේ ගෙදර එහෙම ගින්නක් ඇවිලුනේ අපි නිසා!"කියලා
මම ඇහුවා, "මොකද වුනේ? කියලා "




භූතයා කිව්වා, "අපි ගෙදර හිටියා. එක පාරටම, ගින්නක් ඇවිලුනා..." එත් අපි දන්නේ නෑ ඒක කොහොමද වුනේ කියලවත්"




මන් කිව්වා මේ ගෙදර ගින්න ඇවිලුනේ ගෙදර තියෙන නිදන කාමරයකින්. "මේක තමයි ඒ රහස !"කියලා

භූතයා කිව්වා, "හරි! ඔයා දැන් දිනුවා!" කියලා



මම බූතයත් එක්ක  ඒ නිදන කාමරයට ගියා. "හහ්! මේක තමයි ඒ  රහස!" කියලා මම කිව්වා

බූතයා කිව්වා, "මේක තමයි මේකෙ අවසානය!" කියලා


බූතයාගේ ශාපය ඉවර වෙලා බූතයා ගෙදරින් ගියා. ඒත් එක්කම මම ගෙදරින් එලියට ආවා.
"කොහොම හරි අන්තිමේදී මමයි බූතයයි දෙන්නම ඒ බූත බංගලාවෙන් නිදහස් වුනා !".



මම ඉක්මනට ගෙදර ආවා. අම්මා ඇහුවා, "මොකද ඔයාට වුනේ?" කියලා

මම කිව්වා, "මම බූත බංගලාවකට ගිහින් ඒකෙ බූතයගේ ශාපෙත් බිදලා ඒයාවත් බේරගෙන මමත් බේරුනා !" කියලා

ඊට පස්සේ මට අම්මගේ අතේම නින්ද ගියා



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)